# 1818 නිදහස් අරගලය තුළ ඇල්ලේපොල දිසාවගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ඓතිහාසික විමර්ශනයක්

මධුවන්ති ආර්.එම්.එස්.අයි.[1]

ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී ශ්‍රී ලාංකිකයන් විසින් ඉංග්‍රීසින්ට විරුද්ධව නැඟී සිටි පළමු අරගලය ලෙස සැලකෙන්නේ ක්‍රි.ව. 1818 දී ඇති වූ නිදහස් අරගලයයි. මෙම කැරැල්ල තුළ ප්‍රධාන ස්ථානයක් හිමිකොට ගනිමින් කටයුතු කළ අතීත සිංහල වීරවරයෙකු ලෙස ඇල්ලේපොල මහ නිලමේ චරිතය හඳුනාගත හැකිය. මාතලේ ඇල්ලේපොල නමින් හැඳින්වෙන පරපුරින් පැවත එන කහඳ මහන්තේ නවරත්න වික්‍රමසිංහ මුදියන්සේ සහ කහඳේ දිසාව යන නාමයන්ගෙන් ද ඇල්ලේපොල නිලමේ හැඳින්වෙන අතර රාජද්‍රෝහියෙකු වශයෙන් මරණීය දණ්ඩනයට නියමව සිටි මොහු ශ්‍රී වික්‍රම රාජසිංහ රජු යටතේ තුන්කෝරල දිසාවේ සහ දෙවන අධිකාරම් යනාදී වශයෙන් උසස් තනතුරු හෙබවූවකු මෙන් ම මුල් කාලීනව ඉංග්‍රීසින්ගේ ද අවධානය දිනා ගනිමින් අධිකාරම්වරයෙකු හට පමණක් ම හෙබවිය හැකි තනතුරු ලෙස සැලකූ සැතපෙනගේ මුහන්දිරම්, අතපත්තු මුරපොලේ මුහන්දිරම් සහ රන් ආයුධ මඩමේ ලේකම් යන තනතුරු හෙබවූ වැඩිහිටි රදළ ප්‍රධානියෙකු වූ මොහු මහනුවර නාථ දේවාලයෙහි බස්නායක නිලමේ තනතුර ද හෙබවූවෙකි. ඉංග්‍රීසින් යටතේ කොතෙක් නම්බු නාමයන් ලැබුන ද එකී තානාන්තර පසෙකලමින් නිදහස් සටන වෙනුවෙන් සටන් කර සිංහලයන්ගේ අවාසනාවට මෙන් සටන පරාජයට පත් වූ අවස්ථාවේදී ඉංග්‍රීසින් අතට පත් ප්‍රථම සිංහල කැරලි නායකයා ලෙස ද ඇල්ලේපොල සැලකේ. ඓතිහාසික වශයෙන් උදාර සේවයක් කළ මෙම චරිතය පිළිබඳව මෙතෙක් පැහැදිලි විමර්ෂණයක් සිදුව ඇති ආකාරය දක්නට නොලැබෙන අතර විශේෂත්වය වන්නේ උඩරට සිටි රදළ ප්‍රධානීන් අතුරින් ඉතාමත් ශූර විචක්ෂණ බුද්ධියකින් යුක්ත වූ ජාතික හැඟීම වෙනුවෙන් ඉංග්‍රීසින්ගේ නම්බු නාම ඉදිරියේ හිස නොනැමූ ජාතික වීරයන් සමඟ එක්ව පුරෝගාමීව කටයුතු කළ නායකයෙකු වීමයි. කැරැල්ලට නායකත්වය ලබා දීමට ඉදිරිපත් වීමත් සමග මොහු මාතලේ දිසාවේ ලෙසට කටයුතු කර තිබේ. ඉංග්‍රීසින්ට විරුද්ධව කටයුතු කළ නිසා ඔවුන්ගේ දැඩි ක්‍රෝධයට ලක්ව සිටි ඇල්ලේපොල පිළිබඳව ඉංග්‍රීසින් නිරන්තර අවධානයෙන් සිටි අතර මෙවන් පසුබිමක කාර්යශූර වුවද වයෝවෘද්ධව සිටි මෙතුමා සිංහලයන්ගේ අවාසනාවකට මෙන් උඩුදුම්බර ගම්පහ කෝරළයේ බඹරබැද්ද නම් ප්‍රදේශයේ දී ඉංග්‍රීසින්ගේ ග්‍රහණයට නතු වූයේ කුමාරිහාමි ද සමගිණි. නිදහස් අරගලය තුළ දැඩි දායකත්වයක් ලබා දුන් මොහුගේ කාර්යයභාරය ඇගයීමට ලක් වී නොමැති බැවින් 1818 නිදහස් අරගලය තුළ ඇල්ලේපොල දිසාවගේ ක්‍රියාකාරීත්වය හා දායකත්වය ප්‍රමාණය කිරීම වැදගත් වේ. ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් මෙම අරමුණ සඵල කරගැනීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

**මුඛ්‍ය පද** : 1818 නිදහස් අරගලය, රදළ, ඇල්ලේපොළ දිසාව, ක්‍රියාකාරීත්වය, දායකත්වය

[1]ඉතිහාසය අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, isharas089@gmail.com